# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය.

சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

## PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මැතිතුමා,
ගරු අමාත්‍ය,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,

2017.07.03

ගරු අමාත්‍යතුමනි,

**අංක 2013/19 ගැසට් පත්‍රයේ වලංගු වන දිනය දීර්ඝ කිරීම.**

පළාත් පාලන ඡන්ද විමසීම මේ වන විට වසර දෙකකට වැඩි කාලයක් කල් දැමීමට ලක්වී ඇති අතර මැතිවරණ පැවැත්වීමට පැවැති බාධක එකින් එක ඉවත්වමින් පවතින මොහොතක සහ මැතිවරණය පිළිබඳ විවිධ දේශපාලන මතවාද හරහා මැතිවරණ කල් දැමීමට ලක් වන බවට විශාල සමාජ අවිශ්වාසයක් ඇති වී තිබෙන මොහොතක කිසිදු පැහැදිලි කිරීමකින් තොරව සංස්ථාපිත ගැසට් පත්‍රයේ බලාත්මක දිනය මාස කිහිපයක් ඉදිරියට ගෙන යාම එම සැකය බලවත් ලෙස තහවුරු කරන්නෙකි.

මේ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්තුමා උපුටා දක්වමින් එකී දිනය වෙනස්වීම මැතිවරණ පැවැත්වීමට කිසිදු බාධාවක් නොවන බවට මාධ්‍ය ප්‍රකාශය පල විය. ගරු අමාත්‍යතුමනි, යම් හෙයකින් මෙම ගැසට් නිවේදනය මැතිවණ පැවැත්වීමට බාධාවක් වුවහොත් එහි සම්පූර්ණ වගකීම ඔබතුමා හා ඔබ අමාත්‍යාංශය දැරිය යුතු වනු ඇත.

එබැවින් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය බලපෑම් එල්ල වන මෙම සංවේදී කරුණු පිළිබඳ පහත සඳහන් කරුණු පැහැදිලි කර ජනතාව දැනුවත් කරමින් ප්‍රකාශයබක් කරන ලෙසද අපවද ලිඛිතව දැනුවත් කරන ලෙසද කාරුණිකව ඉල්ලා සිටිමි.

1. මෙම දිනය දීර්ඝ කිරීමේ නීතිමය අවශ්‍යතාවය
2. ගැසට් පත්‍රයේ වලංගු වන දිනය දීර්ඝ කිරීම හරහා අප්‍රේල් 7 වන දින අංක 2013/19 ගැසට් පත්‍රයේ සඳහන් ඒ ඒ පළාත් පාලන ආයතන වල සහික ප්‍රමාණයන් අනුව ඔක්තෝම්බර් 01 දිනට පෙර නාම යෝජනා කැඳවීමට මැතිවරණ කොමිෂන් සභාවට නීතිමය බාධාවක් තිබේද යන බව
3. මෙම දිනයට වෙනස් කිරීම හරහා පළාත් පලාන මැතිවරණ්‍යය ඔක්තෝම්බර් 01 වන දිනට පෙරාතුව පැවැත්වීමට කිසියම් නීතිමය බාධාවක් තිබේද යන බව (තාක්ෂණික ගැටළු වලට අදාල පනත් කෙටුම් පත ඉදිරි සති කිහිපය තුළ සම්මත කරනු ඇති බවට අපේක්ෂා කෙරේ)

එමෙන්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති තාක්ෂණික ගැටළු වලට අදාල පනත සම්මත කර ගැනීම සඳහා විශය භාර අමාත්‍යවරයා ලෙස ඔබතුමා කටයුතු කරනු ඇතැයි විශ්වාස කරන අතර එහිදී 5% අවම ඡන්ද සීමාව ඉවත් කිරීමට කටයුතු කල එැකි නම් එය විසුරුණු ඡන්ද පදනමක් සහිත කුඩා දේශපාලන පක්ෂ වල නියෝජනය තහවුරු කරන්නට වනු ඇති බවද අවධාරණය කරනු කැමැත්තෙමු.

මෙම සංවේදී කරුණු පිළිබඳ ඔබතුමාගේ කඩිනම් අවධානය යොමු කරනු ඇතැයි අපේක්ෂා කරමු.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂක

පිටපත - මහින්ද දේශප්‍රිය මැතිතුමා, සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
උනන්දුවක් දක්වන සෙසු ආයතන

# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443
E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk

Scanned by CamScanner